// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2312/06 – 2022 දෙසැම්බර් 27 වැනි අඟහරුවාදා – 2022.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2017/251.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2018.08.17 දිනැති හා අංක 2084/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ගම්මාන පාර, පළමු පටුමග, අංක 22/1 හි පදිංචි පී. ඒ. මුහන්දිරම්ගේ මයා සහ මල්වාන, වල්ගම, බ්ලොක් ''A'', ලොට් 15 හි ලුමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 38425 – 18 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ගොනු අංක : IR/COM/01/2017/251.
*නඩු අංකය:* A/62/2018.

පී. ඒ. මුහන්දිරම්ගේ මයා,
අංක. 22/1, පළමු පටුමග,
ගම්මාන පාර,
මහරගම.

පළමු පාර්ශ්වය

**එදිරිව**

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගම,
ලොට් 15, බ්ලොක් "A",
වල්ගම, මල්වාන.

දෙවන පාර්ශ්වය

වර්ෂ 2022 ක් වූ ඔක්තෝබර් මස 31 වන දින දීය.

**බලතල පැවරීම.**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හිටපු අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත්වලින් සංශෝධිත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආරාවුල බේරුම් කිරීම සඳහා එල්. ආර්. සුමතිපාල වන මා වෙත පවරා දී තිබේ.

**පාර්ශ්වයන් අතර උද්ගතව පවත්නා ආරාවුලේ ස්වභාවය.**

මල්වාන, වල්ගම, බ්ලොක් ඒ හි ලොට් 15 දරන ස්ථානයේ පිහිටි ලූමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගමට අනුයුක්තව වර්ෂ 2011 ක් වූ දෙසැම්බර් මස 01 දින සිට වර්ෂ 2014 ක් වූ ජූලි මස 23 දින දක්වා වූ කාලය තුළ සේවයේ නිරතව සිටි පී. ඒ. මුහන්දිරම්ගේ මහතාට ආයතනය විසින් වර්ෂ 2011 ක් වූ නොවැම්බර් මස 20 වැනි දිනැතිව නිකුත් කරනු ලැබ තිබෙන (පැ. 1 වශයෙන් සළකුණු කර ඇති) පත්වීම් ලිපියේ 05 වන ඡේදය ප්‍රකාරව ඔහුට මාසිකව ගෙවිය යුතුව තිබෙන ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව පිළිවෙලින් රු. 60,000 රු. 15,000 ක් වශයෙන් වූ මුදල අදාළ කාලය තුළ ඔහු වෙත ගෙවීමට කටයුතු නොකරන ලද බවට වූ කරුණ මුල්කරගත් ආරාවුල වේ.

**මාගේ කාර්යභාරය.**

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගමේ සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුරේ සේවය කරන ලද පී. ඒ. මුහන්දිරම්ගේ මහතාට තම සේවා කාලය තුළ සේවා ගිවිසුමේ ප්‍රකාරව ප්‍රවාහන දීමනාව සහ රියැදුරු දීමනාව එකී සමාගම විසින් නොගෙවීම යුක්ති සහගත වන්නේ ද එසේ නොවේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න වේ. එමෙන්ම වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 06 දිනැති යොමුවට අනුව ඉන්ධන දීමනාව සම්බන්ධයෙන් ද සැලකිල්ල යොමු කර තිබුණද පැ. 01 දරන පත්වීම් ලිපියට අනුව හා වෙනත් ලියවිල්ලකින් එවැනි දීමනාවක් පිළිබඳව සඳහන් නොවන බැවින් ඒ කෙරෙහි මාගේ අවධානය යොමු නොකිරීමට තීරණය කරන අතර නඩුව විභාගයට ගැනීමේදී ඉදිරිපත් වන කරුණු හා සාධකයක් මත පමණක් ඒ ඒ අවස්ථානුකූලව ඒ පිළිබඳව සළකා බැලීම මාගේ කාර්යභාරය වී තිබේ.

**පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම.**

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන නියෝගය යටතේ හා 1959 මාර්තු මස 02 දිනැති හා අංක 11688 දරන *ගැසට්* පත්‍රය මගින් ප්‍රකාශයන්ට පත්කරන ලද 1969 කාර්මික ආරවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගයට අනුව පාර්ශ්වයන් විසින් ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව විස්තර ප්‍රකාශයන් ඉදිරිපත් කර තිබේ. ඊට අනුව පළමු පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ තමන් වෙත ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව වශයෙන් රුපියල් විසිහත් ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය හැට හතක (රු. 2,774,867.00) මුදලක් ලැබිය යුතුව තිබෙන බවය. දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ පළමු පාර්ශ්වය වෙත තමන් විසින් රුපියල් තිස්නව ලක්ෂ නවදහස් හත්සිය පනහක (රු. 3,909,750.00) ක මුදලක් ගෙවා තිබෙන බවත් එම නිසා මේ වන විටත් පළමු පාර්ශ්වය වෙත රුපියල් එකලොස් ලක්ෂ තිස් හතර දහස් අටසිය අසූ තුනක (රු. 1,134,883.00) මුදලක් වැඩිපුර ගෙවා තිබෙන බැවින් එකී මුදල තමන් වෙත ආපසු ලැබිය යුතුව තිබෙන බවත්ය.

පර්ශ්වයන්ගේ කරුණු දැක්වීමෙන් ඉක්බිතිව කිසියම් සමථයකට එළඹිය හැකිවේද යන්න පිළිබඳ සාකච්ඡා කළද එහි සාර්ථක බවක් දැකිය හැකි නොවූයෙන් මෙම නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර එහිදී විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳවත් පාර්ශ්වයන්ගේ පිළිගැනීම් පිළිබඳවත් අවධානය යොමු කළෙමි.

**විසඳිය යුතු ප්‍රශ්න**

1. පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සේව්‍ය සේවක සම්බන්ධතාවයක් පවතී ද යන්න.

2. එසේ නම් ඒ කුමන පදනමකින් ද යන්න හා සමස්ථ සේවා කාලය කොපමණ ද යන්න.

3. දෙවන පාර්ශ්වය වෙතින් පළමු පාර්ශ්වය වෙත ප්‍රවාහන දීමනාවක් හා රියැදුරු දීමනාවක් ගෙවීමට එකඟතාවයක් පවතී ද යන්න.

4. එසේ නම් එය ගෙවන ආකාරය හා ගෙවීම් ප්‍රමාණය කොපමණ ද යන්න.

5. එම ගෙවීම් නිසියාකාරව හා පූර්ණ වශයෙන් ගෙවනු ලැබ තිබේ ද යන්න හා නැතහොත් එහි යම්කිසි හිඟයක් පවතී ද එසේ නම් ඒ කොපමණ ප්‍රමාණයක් ද යන්න.

6. අදාළ දීමනා පූර්ණ වශයෙන් හෝ කිසියම් ප්‍රමාණයක් වශයෙන් හෝ නොගෙවා පවතී නම් එය සාධාරණීකරනය කිරීමට සාධක පවතින්නේ ද යන්න.

**පිළිගැනීම්**

පාර්ශ්වයන් විසින් පහත සඳහන් මූලික පිළිගැනීම් සිදුකර තිබෙන බැවින් නඩු විභාගයේදී එම කරුණු සම්බන්ධයෙන් තවදුරටත් හබ කිරීමෙන් වැළකීමට පාර්ශ්වයන්ට අවස්ථාව සළසා දෙමින් දැනුවත් කරන ලදී.

1. පළමු පාර්ශ්වය වෙත පිරිනමන ලද පත්වීම, තනතුර, මුල්පත්වීම් දිනය හා තනතුරෙහි ස්ථිර කිරීම පිළිගන්නා බව.

2. මුල් පත්වීම් දිනය වර්ෂ 2011 දෙසැම්බර් මස 01 දින බව. (යොමුවට අනුව එය 2011 ඔක්තෝබර් මස 01 වශයෙන් සටහන් වී තිබීම බැහැර කෙරේ)

3. සේවය අවසන් වීම වර්ෂ 2014 ජූලි මස 23 දින බව.

4. ඒ අනුව සේවා කාලය වසර 02 මාස 07 දින 23 ක් බව.

5. මාසික වැටුප රු. 200,000 ක් බව ප්‍රවාහන දීමනාව මාසිකව රු. 60,000 ක් බව හා රියැදුරු දීමනාව මාසිකව රු. 15,000 ක් බව.

ඉහත දැක්වෙන ප්‍රශ්නයන්ට විසඳුම් ලබාගැනීම තුළින් මා වෙත පැවරී ඇති කාර්යභාරය සම්පූර්ණ කිරීම සඳහා නඩුව විභාගයට ගන්නා ලද අතර එහිදී ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීම පළමු පාර්ශ්වය වෙත භාර කළෙමි. ඒ අනුව පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදෙන ලද එකම තැනැත්තා වූයේ පී. ඒ. මුහන්දිරම්ගේ යන අයයි. ඔහු ඉතා දීර්ඝ වශයෙන් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේ

තමන් රු. 4,250,000 ක මුදලක් අවස්ථා හතරකදී ආයතනය වෙත පෞද්ගලික ණය වශයෙන් ලබා දෙන ලද බවත් පසුව එය ආපසු නොගෙවීම හේතු කරගෙන ඊට වඩා අඩු මුදලක් ලබා ගැනීමෙන් එය සමථයකට පත්වූ බවත්ය. එහිදී වැඩිදුරටත් සාක්ෂි ලබාදෙමින් ඔහු ප්‍රකාශ කර සිටියේ තමන්ගේ මුල් පත්වීම් දින එනම් 2011.12.01 දින සිට තමන්ගේ සේවය අවසන් වූ දින එනම් 2014.07.23 දින දක්වාම තමන්ට සේවා ගිවිසුම පරිදි හිමිවිය යුතු ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව නොගෙවන ලද බවය. පළමු පාර්ශ්වය විසින් පැ. 01 වශයෙන් සළකුණු කරන ලද 2011.11.20 දිනැති පත්වීම් ලිපියේ 05 ඡේදයට අනුව පී. ඒ. මුහන්දිරම්ගේ යන අයට ප්‍රවාහන දීමනාව වශයෙන් මාසිකව රු. 60,000 ද, රියැදුරු දීමනාව වශයෙන් මාසිකව රු. 15,000 ක මුදලක් ද, ගෙවීමට පාර්ශ්වකරුවන් එකඟ වී තිබේ. වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 06 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපියේ ඉන්ධන දීමනාව පිළිබඳ සඳහන් වුවද සේවා ගිවිසුමේ 05 වන ඡේදය යටතේ ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව හැරුණු විට වෙනත් දීමනා පිළිබඳව සඳහන්ව නැත. ඒ හැරුණුවිට සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ තමන් ඉන්ධන දීමනාව ඉල්ලන්නේ නැති බවයි. (2019.06.21 සාක්ෂි සටහන්හි 09 පිටුව) සාක්ෂිකරු විසින් 2016.11.14 දින කම්කරු කොමසාරිස්වරයා වෙත ලිපියක් ඉදිරිපත් කරමින් තමන්ට හිමි මුදල් නොගෙවන ලද බවත්, ප්‍රවාහන, රියැදුරු හා ඉන්ධන දීමනා වශයෙන් රු. 3,597,367.00 ක මුදලක් හිමිවිය යුතුව තිබූ බවත් ප්‍රකාශ කර ඇත. අදාළ ලිපිය පැ. 16 වශයෙන් ද නොගෙවන ලද මුදල සඳහන් කොටස පැ. 16(අ) වශයෙන් ද සළකුණු කර තිබේ. ඒ කෙසේ වෙතත් පාර්ශ්වයන් අතර එකඟතාවයට එළඹීමක් ලෙස හබ කිරීමකින් තොරව පිළිගැනුන සේවා ගිවිසුමෙහි ඉන්ධන දීමනාවක් පිළිබඳව සඳහන් නොවන නිසාත් සාක්ෂිකරු ඉන්ධන දීමනාවක් නොඉල්ලන බවට කරන ප්‍රකාශයන් නිසාත් එවැනි ගෙවීමක් සිදු කරන බවට දෙවන පාර්ශ්වය එකඟ වූ බවට නඩු විභාගයේ දී තහවුරු කෙරෙන සාධක ඉදිරිපත් නොවූ නිසාත් ඉන්ධන දීමනාව සම්බන්ධයෙන් සැළකිලිමත් නොවීමට තීරණය කරන ලදී.

මෙම නඩුවට අදාළ පාර්ශ්වයන් අතර පවත්නා සම්බන්ධතාවය කුමක්ද යන්න පිළිබඳ සළකා බැලීමේදී සාක්ෂි මෙහෙයවමින් පළමු පාර්ශ්වය විසින් සලකුණු කරන ලද පැ. 1 දරන ලේඛනය ඉතා වැදගත් සාධකයක් විය. එහි අන්තර්ගතය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී එය ඉතා පැහැදිලිවම සේවා ගිවිසුමක් බවත් ඒ අනුව පළමු හා දෙවන පාර්ශ්වයන් අතර සේව්‍ය සේවක සම්බන්ධතාවයක් හටගෙන තිබුණ බවත් නිරීක්ෂණය කළෙමි. මෙම සේවා ගිවිසුම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කිසිවිටෙකත් හබ කිරීමක් නොකළ බැවින්, පාර්ශ්වයන් අතර සේව්‍ය සේවක සබඳතාවයක් උද්ගතව පැවති බවට මූලික වශයෙන් තීරණය කරමි. එමෙන්ම පළමු පාර්ශ්වයේ මුල් පත්වීම් දිනය යොමුගත ලිපියේ 2011.10.01 වශයෙන් සඳහන්ව තිබුණද නඩු විභාගයේදී ඉදිරිපත් වූ සාධක හා කරුණු අනුව පළමු පාර්ශ්වයේ මුල්පත්වීම් දිනය 2011.12.01 ලෙස සැළකීමට ද තීරණය කළෙමි. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් කිසිදු හබ කිරීමක් සිදු කළේ ද නැත. එම නිසා යොමුගත ලිපියෙහි සඳහන් දිනය දෝෂ සහගත බවට ද තීරණය කරමි. පළමු පාර්ශ්වයේ සේවය අවසන් වීම 2014.07.23 බවට නඩු විභාගයේදී කරුණු හෙළිදරව් වූ බැවින් හා ඒ සම්බන්ධයෙන් ද පාර්ශ්වයන් කිසිවකුත් හබ කිරීමක් සිදු නොකළ බැවින් සම්පූර්ණ සේවා කාලය වසර 02 මාස 07 දින 23 ක් බවට තීරණය කරමි. පළමු පාර්ශ්වය සිය සාක්ෂි මෙහෙයවමින් සළකුණු කරන ලද පැ. 01 දරන ලේඛනයේ 05 වන ඡේදය අනුව දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත ප්‍රවාහන දීමනාව වශයෙන් මාසිකව රු. 60,000 ක මුදලක් ද රියැදුරු දීමනාව වශයෙන් මාසිකව රු. 15,000 ක මුදලක් ද ගෙවන බවට එකඟතාවය ප්‍රකාශ වී තිබෙන බව පෙනී යයි. පළමු පාර්ශ්වය විසින් එම ලේඛනය අදාළ කොන්දේසින්ට යටත්ව භාර ගන්නා බවට එහි අත්සන් තබා තිබෙන බවක් හෙළිදරව් නොවුවද සේවය සඳහා වාර්තා කිරීම තුළින් එකී කොන්දේසිය මෙන්ම එහි ඇතුළත් අනෙකුත් නීත්‍යානුකූල වූ කොන්දේසීන් පිළිගන්නා ලද බවට තීරණය කරනු ලබන්නේ ඒ සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර හබ කිරීමක් කළද සිදු නොවූ බැවිනි. එම නිසා ඊට අදාළ අනෙකුත් අවශ්‍යතා පළමු පාර්ශ්වය විසින් ඉටු කරනු ලද්දේ නම් ඉහත කී දීමනා ගෙවීමට දෙවන පාර්ශ්වය බැඳෙන බවට තීරණය කරමි. වගඋත්තරකාර පාර්ශ්වය හෙවත් දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි මෙහෙයවීමේදී මෙම දීමනාවන්ට අදාළව අනෙකුත් අවශ්‍යතා නිසි පරිදි ඉටු නොකරන ලද බව සාධක සහිතව තහවුරු කළ බවක් හෙළිදරව් නොවීය. රියැදුරු දීමනාව ලබාදීම සඳහා පළමු පාර්ශ්වය විසින් රියැදුරෙකු යොදවාගෙන නොසිටි බවට තර්කයක් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ ද එය ශක්තිමත්ව ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වූවා පමණක් නොව එය ඒ ආකාරයෙන්ම සිදුවීම අවශ්‍යතාවයක් බවට සාධක ඉදිරිපත් කිරීමට ද දෙවන පාර්ශ්වය අසමත් විය. මේ අනුව ගිවිසුම්ගත පරිදි ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත මාසිකව ගෙවීමට බැඳීමක් පැවති බවට තීරණය කරමි. ඒ අනුව අදාළ දීමනා හිමිකම්ගත පරිදි පූර්ණ වශයෙන් ගෙවන ලද්දේ ද නැතහොත් එහි හිඟයක් වේද යන්න සළකා බැලිය යුතුව තිබේ. මේ සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ තම මුල් පත්වීම් දිනයේ සිට සේවය අවසන් වූ දිනය දක්වාම එනම් 2011 දෙසැම්බර් මස සිට 2014 ජූලි මස දක්වාම මෙම දීමනාවන් තමන් වෙත නොගෙවා පැහැර හරින ලද බවයි. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය තම ප්‍රකාශය ඉදිරිපත් කරමින් පැහැදිලි කර ඇත්තේ තමන් විසින් මුහන්දිරම්ගේ යන අයට රු. 3,909,750 ක මුදලක් වැඩිපුර ගෙවා තිබෙන බවත් ඒ අනුව ඔහුට නොගෙවන ලද බවට ප්‍රකාශිත දීමනා සඳහා රු. 2,774,867 ක මුදලක් ගෙවීමට තිබෙන බව තම සමාගම පිළිගන්නා බවත් එය එසේ නම් පළමු පාර්ශ්වය වෙතින් දෙවන පාර්ශ්වය වෙත රු. 1,134,883 ක මුදලක් ආපසු ලැබිය යුතුව තිබෙන බවත්ය. එහෙත් දෙවන පාර්ශ්වය තම සාක්ෂි මෙහෙය වීමේදී රු. 3,909,750 මුදල ගෙවන ලද්දේ කුමණ කරුණක් සඳහා ද යන්නත් නොගෙවන ලද දීමනා වශයෙන් රු. 2,774,867 ක මුදල ගණනය කරන ලද්දේ කුමන ආකාරයෙන් ද යන්නත් පැහැදිලි කිරීමට කටයුතු කළේ නැත.

## ප්‍රදානය

එහෙත් ඉන් එක් කරුණක් පැහැදිලි විය. එනම් පළමු පාර්ශ්වය වෙත ප්‍රවාහන හා රියැදුරු දීමනා වශයෙන් රු. 2,774,867 ක මුදලක් ගෙවීමට තිබෙන බවය. ඒ අනුව මේ සියලු කරුණු එක්ව ගත් විට හා නඩු විභාගයේදී ඉදිරිපත් වූ සාධකයන් මත පිහිටා දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත ගිවිසුම්ගත පරිදි වර්ෂ 2011 ක් වූ දෙසැම්බර් මස 01 දින සිට 2014 ක් වූ ජූලි මස 23 දක්වා වූ කාලය සඳහා ප්‍රවාහන දීමනාව හා රියැදුරු දීමනාව නොගෙවන ලද බවට තීරණය කරමි. එය ප්‍රවාහන දීමනාව වශයෙන් මාසිකව රු. 60,000 ක්ද, රියැදුරු දීමනාව වශයෙන් මාසිකව රු. 15,000 ක්ද, ලෙස ගෙන සම්පූර්ණ සේවා කාලය වූ වසර 02 මාස 7 දින 23 ක් සඳහා ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිතුන් ලක්ෂ අසූ දෙදහස් පන්සියයක (රු. 2,382,500) මුදලක් වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 16 වන දින හෝ ඊට පෙර දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත ගෙවීම සඳහා උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු බවට නියෝග කරමි. පළමු පාර්ශ්වය තම ගිවිසුම්ගත හිමිකම සම්බන්ධයෙන් හා මාසිකව එය නොලැබීයාම සම්බන්ධයෙන් මෙන්ම තම සේවය අවසන්විද වසර ගණනාවක් ගතවන තෙක් එය ලබා ගැනීම සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම හේතුකර ගෙනද මෙම මුදල සඳහා කිසිදු පොලී මුදලක් ගණනය නොකිරීමට තීරණය කරමි.

මෙම මුදල සඳහා සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්ති භාර මුදල් අදාල නොවන බවද සැළකිය යුතුය.

මෙම ප්‍රදානය යුක්ති සහගත හා සාධාරණ වූ තීන්දු ප්‍රකාශයක් බවට මින් සහතික කරමි.

එල්. ආර්. සුමතිපාල,
බේරුම්කරු.

EOG12 - 0321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.